## 292 සුරලොවේ දෙවිඳුන්

සුරලොවේ දෙවිඳුන් හට මහිමය වේවා
මනු ලොවේ සුසිතුන් හට සාමය වේවා
දෙව් ස්වාමිනි සගේ රජිඳුනි
සියලු බලැති දෙව් පියාණනි
අපි ඔබ තුම පසසමු ඔබ ගුණ වනමු
ඔබ නමදිමු ඔබේ මහත් මහිමය සඳහා
ඔබට තුති පුද කරමු
දෙවිඳු එකමැ පුතනු සමිඳුනි
ජේසු ක්‍රිස්තුනි දෙව් ස්වාමිනි
දෙව් අජපොව්වාණනි පිය සඳුන් සුතාණනි
ලෝ පව් දුරලන ඔබේ
කරුණා නෙත් අප වෙතේ
යොමු කළ මැන හිමි සඳේ
අයැදුම පිළිගනු මැනේ
පියතුම දකුණේ වැඩ වසනා
කළ මැන අප හට ඔබ කරුණා
සුදතුන් සමඟින් දෙව්පිය මහිමේ
නිවසන කිතු සමිඳේ
ඔබමයැ එක සුදු තැනැත්තාණෝ
ඔබම යැ එක සුර සමිඳාණෝ
ඔබම යැ එක අති උතුමාණෝ  ආ.....මෙන්